# මිලින්ද මොරගොඩ ඉන්දීය මහ කොමසාරිස් ධුරයේ වැඩ බාරගෙන





**ඉන්දියාවේ මහ කොමසාරිස්වරයා වශයෙන් නම් කළ මිලින්ද මොරගොඩ මහතා ඊයේ (30) පෙරවරුවේ නවදිල්ලියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ දී නිල රාජකාරි ඇරඹීය.**

වැඩබලන මහ කොමසාරිස් නිලුක කදුරුගමුව මහතා ඇතුළු කාර්ය මණ්ඩලය අභිනව මහ කොමසාරිස්වරයා පිළිගත් අතර ආගමික කටයුතු වලින් අනතුරුව මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මැද රාජකාරි ආරම්භ කරන ලේඛනවලට අත්සන් තැබීය. ආචාර්ය තියංගොඩ විජිතසිරි, සියම් නිකායේ මල්වතු පාර්ශවයේ අනුනාහිමියන් පිරිස පංචශීලයෙහි පිහිට වූ අතර තිරිකුණාමලයේ ආනන්ද අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායේ මහ නාහිමි මහාචාර්ය කොටපිටියේ රාහුල, සියම් නිකායේ කෝට්ටේ ශ්‍රී සාමග්‍රි සංඝ සභාවේ අනු නාහිමි මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත කැලණිය රජමහා විහාරාධිපති හිමි සහ මහාබෝධි ඉන්දියානු සංගමයේ මහ ලේකම් පැලවත්තේ සීවලී යන හිමිපාණන් වහන්සේලා සූම් ඇප් යෙදවුම මගින් අන්තර්ජාලය භාවිත කර සෙත් පිරිත් දේශනා කිරීම විශේෂත්වයක් විය.

ශ්‍රී ලංකාවේ සංවර්ධන අවශ්‍යතා සලකා කැපවීමෙන් හා කණ්ඩායම් හැඟීමකින් ක්‍රියා කරන අතර දැනට පවතින අසීරු අවස්ථාවේ දී විදේශගත දූත මණ්ඩල නියෝජිතයන් රට වෙනුවෙන් කරන සේවාව අගය කරන බව ද මිලින්ද මොරගොඩ මහ කොමසාරිස් ධුරයෙහි වැඩ බාරගනිමින් කියා සිටියේය.